## ලංසු කැඳවීමයි.

# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL)

**2025 වර්ෂය සඳහා තොග ගබඩා පර්යන්තය මුතුරාජවෙල ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා ලංසු කැඳවීමයි.**

**(ලංසු අංකය KPR/18/2025)**

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ (CPSTL) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2025 වර්ෂය සඳහා මුතුරාජවෙල තොග ගබඩා පර්යන්තයෙහි ප්‍රධාන ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා පිළිගත් ආපනශාලා සේවාවන් සපයන්නන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු මිල ගණන් කැඳවනු ලැබේ.

අපගේ (CPSTL) වෙබ් අඩවිය වන www.cpstl.lk වෙතින් ලංසුකරණය පිළිබඳ විස්තර තොරතුරු ලබාගත හැකි අතර, කළමණාකරු (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් (ඉල්ලීමක්) ඉදිරිපත් කිරීමෙන් හා ආපසු **නොගෙවන** රුපියල් දහසක (රු.1000.00) ගාස්තුවක් **CPSTL** ආයතනයට ගෙවීමෙන් 2025.04.01 **වන දින සිට** 2025.04.23 වන දින 14.00 පැය දක්වා ලංසු ලිපිලේඛන පහත ලිපිනයේ පිහිටි ප්‍රසම්පාදන කාර්යාංශයෙන් ලබාගත හැකිය.

ලංසුපත් භාරගැනීම 2025.04.24 වෙනි දින 14.00 පැයට අවසන් කරනු ලබන අතර, එම වේලාව ඉකුත් වූ වහාම ප්‍රසම්පාදන කළමණාකරුගේ කාර්යාලයේදී එම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ අනුමැතියලත් එක් නියෝජිතයෙකුට පමණක් ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට අවසර ලැබේ.

නිසි අයුරින් සම්පූර්ණ කල මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් 2025.04.24 **වන දින** 1400 පැයට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කොලොන්නාව නිමාව ප්‍රධාන ගේට්ටුව අභියස ආරක්‍ෂක කළමණාකරුගේ කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ද ලංසු ලිපිලේඛන ඉදිරිපත් කල හැකිය. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී **ආරක්ෂිත බැදුම්කරයක් (Bid Bond)** ලෙස ආපසු ගෙවන මුදලින් **රුපියල් දස දහසක** (10,000.00) මුදලක් CPSTL ආයතනය වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් බැංකු අණකරයක් (**ඇමුණුම් අංක** 03) අයදුම්පත සමඟ ඇමිණිය යුතුය. මෙම බැදුම්කරය 2025.07.23 **වන දින දක්වා වලංගු විය යුතුය.**

සියළු තරඟකාරී මිළ ගණන් 2025.06.23 **දින දක්වා වලංගු විය යුතුය.**

සියළුම පැහැදිලි කර ගැනීම් සඳහා දුරකථන 011-2572156 හෝ 0111-2572155 මඟින් ප්‍රසම්පාදන කාර්යාලයෙන් විමසිය හැකිය.

කළමණාකාර ප්‍රසම්පාදන
ප්‍රසම්පාදන කාර්යාලය,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
පළමු මහල, නව ගොඩනැගිල්ල,
කොලොන්නාව,
වැල්ලම්පිටිය